රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

# 2024-08-05 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

## 01. කොළොන්නාවේ ජල ගැලීම් තත්ත්වය

කොළොන්නාව ප්‍රදේශයේ ජල ගැලීම් ඇති වීම සඳහා බලපාන මූලික හේතු සොයා බලා එවැනි තත්ත්වයක් නැවත ඇති වීම වළක්වා ගැනීමට අවශ්‍ය නිර්දේශ ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කිරීමට සහ කොළොන්නාව නගරය ප්‍රතිසංවිධානය සඳහා පුළුල් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට කොළඹ දිස්ත්‍රික් ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කිරීමට 2024-06-03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජල ගැලීම්වලට හේතුවන මූලයන් හඳුනාගෙන නැවත එවැනි තත්ත්වයක් ඇති වීම වැළැක්වීම පිණිස ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් සකස් කරනු ලැබ ඇති වාර්තාව සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරමින් පවතින කොළොන්නාව නගර සංවර්ධන සැලසුම හා කොට්කාවත්ත-මුල්ලේරියාව නගර සංවර්ධන සැලසුම මාස 04ක කාලයක් තුළ සකස් කර ක්‍රියාත්මක කිරීම ඇතුළුව නිර්දේශ 16ක් එම කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ තිබේ. එම නිර්දේශ නිසි අධ්‍යයනයකින් අනතුරුව අදාළ වග කිවයුතු ආයතන හරහා ක්‍රියාත්මක කිරීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය මග පෙන්වීම සහ අධීක්ෂණය සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 02. ඉන්දුනීසියා-ශ්‍රී ලංකා වරණීය වෙළෙඳ ගිවිසුම (ISLPTA)

ඉන්දුනීසියා-ශ්‍රී ලංකා වරණීය වෙළෙඳ ගිවිසුම (ISLPTA) සම්බන්ධයෙන් වන දෙවන වෙළෙඳ සාකච්ඡා කමිටු රැස්වීම 2024-07-15 සහ 16 යන දෙදින කොළඹදී පවත්වා ඇත. ඒ අනුව, යෝජිත ඉන්දුනීසියා-ශ්‍රී ලංකා වරණීය වෙළෙඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා 2024 දෙසැම්බර් මස වන විට අවසන් කිරීමටත්, 2025 මාර්තු මාසයේදී එකී වෙළෙඳ ගිවිසුමට අත්සන් තැබීමටත් දෙපාර්ශ්වය විසින් එකඟ වී ඇති බව සඳහන් කරමින් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ කරුණු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியு, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2514759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

## 03. සමුද්‍රීය අධ්‍යයනය සඳහා කලාපීය මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීම

ඉන්දියන් සාගරය ආශ්‍රිත රටවල සංගමයේ (IORA) සාමාජිකයෙකු වශයෙන් සමුද්‍රීය ආරක්ෂාව සහ ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව විසින් ගනු ලැබ ඇති විවිධ මූලාරම්භයන් සැලකිල්ලට ගනිමින්, පොදු අධ්‍යයනයන් මගින් ලබා ගනු ලබන දැනුම සහ ක්‍රියාමාර්ග කලාපය පුරා බෙදා හැරීමට හැකි වන පරිදි ප්‍රංශ රජය විසින් "කලාපීය සමුද්‍රීය අධ්‍යයන මධ්‍යස්ථානයක්" ස්ථාපිත කිරීම සඳහා වඩාත් යෝග්‍ය ස්ථානය වශයෙන් ශ්‍රී ලංකාව හඳුනාගනු ලැබ ඇත. යෝජිත මධ්‍යස්ථානය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය තුළ පිහිටුවීමටත්, ඒ සඳහා අවශ්‍ය සහාය සහ යටිතල පහසුකම් ත්‍රිකුණාමලය නාවික හා සාගරික විද්‍යා පීඨය මගින් ලබා ගැනීමටත් යෝජනා වී තිබේ. ඒ අනුව, යෝජිත "කලාපීය සමුද්‍රීය අධ්‍යයන මධ්‍යස්ථානය" ස්ථාපිත කිරීමට අදාළව ශ්‍රී ලංකා රජය සහ ප්‍රංශ රජය අතර ද්විපාර්ශ්වික ගිවිසුමකට එළඹීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. රාජ්‍ය සේවාවන්හි කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම

රාජ්‍ය ආයතනවල කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා මෙන්ම ද්විකරණ දෝෂ අවම කිරීම හා තොරතුරු තහවුරු කර ගැනීම මගින් ඵලදායීව හා ප්‍රශස්ථව කාර්යයන් ඉටු කිරීම පිණිස රාජ්‍ය ආයතනයන්හි තොරතුරු තාක්ෂණ පද්ධති ඒකාබද්ධ කිරීම යෝග්‍ය බව හඳුනාගනු ලැබ ඇත. ඒ සඳහා රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළුව සියලුම රාජ්‍ය ආයතන මගින් නියාමනය කරනු ලබන/සංවර්ධනය කරනු ලබන තොරතුරු තාක්ෂණ පද්ධති සඳහා දත්ත ඇතුළත් කිරීමේදී පහත සඳහන් පරිදි කටයුතු කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* වයස අවුරුදු 15ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියෙකු හඳුනාගැනීම සඳහා ජාතික හැඳුනුම්පත් අංකය භාවිත කිරීම අනිවාර්ය කිරීම.

* විදේශීය පුද්ගලයෙකු හඳුනාගැනීම සඳහා ඔහුගේ විදේශ ගමන් බලපත්‍ර අංකය භාවිත කිරීම අනිවාර්ය කිරීම.

* ආයතන අනන්‍යතාව හඳුනාගැනීම සඳහා ව්‍යාපාර ලියාපදිංචි අංකය හා එම ආයතනවල හිමිකරුවන්ගේ/අධ්‍යක්ෂ මණ්ඩලවල දේශීය සාමාජිකයින්ගේ ජාතික හැඳුනුම්පත් අංකය ද විදේශීය සාමාජිකයින්ගේ විදේශ ගමන් බලපත්‍ර අංකය ද භාවිත කිරීම අනිවාර්ය කිරීම.

* අදාළ දත්ත විධිමත් පරිදි අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ හුවමාරු කිරීමට හැකි වන අයුරින් දත්ත ප්‍රමිතිකරණය සිදු කිරීම.

## 05. ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

දිවයින පුරා පිහිටි සියලුම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල එකම කාර්ය පටිපාටියක් අනුගමනය කෙරෙන බව සහතික කිරීමත්, විධිමත් ලියාපදිංචි කිරීමේ සහ සුපරීක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීමත් අරමුණු කර ගනිමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් 2017 වර්ෂයේදී ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා වන ජාතික මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. ඒ අනුව, ළමා දිවා සුරැකුම් සේවාව සෑම පළාතක් තුළම ඒකමිතියකින් ක්‍රියාත්මක කිරීමටත්, විධිමත් නියාමන හා අධීක්ෂණ යාන්ත්‍රණයක් හඳුන්වා දීම සහතික කිරීමටත් ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කරනු ලැබ තිබේ. එකී ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. පැඟිරිවත්ත දුම්රිය ස්ථානයේ සිට පාදුක්ක දුම්රිය ස්ථානය දක්වා කැලණිවැලි දුම්රිය මාර්ග රක්ෂිතයේ පදිංචිව සිටින අනවසර පදිංචිකරුවන් ප්‍රතිස්ථාපනය කිරීම

කොළඹ තදාසන්න දුම්රිය මාර්ග ව්‍යාපෘතිය යටතේ දේශීය අරමුදල් යොදා ගනිමින් මාළිගාවත්ත ලොකෝ මංසන්ධියේ සිට පාදුක්ක දුම්රිය ස්ථානය දක්වා දුම්රිය මාර්ග රක්ෂිතය තුළ වූ අනවසර පදිංචිකරුවන් ප්‍රතිස්ථාපනය කරනු ලබන අතර, මේ වන විට කිරුළපන දුම්රිය ස්ථානය දක්වා වන කොටසේ අනවසර පදිංචිකරුවන් ප්‍රතිස්ථාපන කටයුතු අවසන් කර ඇත. පැඟිරිවත්ත දුම්රිය ස්ථානයේ සිට පාදුක්ක දුම්රිය ස්ථානය දක්වා කොටසෙහි දුම්රිය රක්ෂිතයේ පදිංචිකරුවන්ගෙන් වැඩි ප්‍රතිශතයක් වසර 30කට අධික කාලයක් දුම්රිය රක්ෂිතයේ අනාරක්ෂිත ලෙස

අනවසරයෙන් ජීවත් වන අතර, ඔවුන්ගෙන් පවුල් 350ක් පමණ නැවත පදිංචි කිරීම සඳහා හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරියට අයත් කොළඹගේ මාවත නිවාස සංකීර්ණයේ සහ දුම්රිය මාර්ග ව්‍යාපෘතිය මඟින් කොට්ටාව මාලපල්ල ප්‍රදේශයේ ඉදි කෙරෙමින් පවතින නිවාස සංකීර්ණයේ නිවාස ඒකක යොදා ගනිමින්, එකී පවුල් සඳහා නිවාස පහසුකම් සලසා දීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අතර උපකරණ පැවරීම පිළිබඳ ගිවිසුම**

හරිත දේශගුණික අරමුදල මඟින් අරමුදල් සපයනු ලබන සහ කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය මඟින් තාක්ෂණික සහාය ලබා දෙන, නකල්ස් කඳුකරයේ අවදානමට ලක් විය හැකි ගංගා ද්‍රෝණිවල, ජලාධාර ප්‍රදේශවල සහ පහළ නිම්න ප්‍රදේශවල පදිංචි යැපුම් ගොවීන්ගේ හා කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට අනුහුරු වීමේ හැකියාව ශක්තිමත් කිරීමේ අරමුණින් වාරිමාර්ග අමාත්‍යාංශය විසින් නකල්ස් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. එම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක එක් සංරචකයක් වශයෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාංශු වර්ණාවලීක්ෂ රසායනාගාරයක් ස්ථාපිත කිරීමට නියමිතව ඇත. ඒ සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමට කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය එකඟතාව පළ කර තිබේ. ඒ අනුව, එකී උපකරණ ලබා ගැනීම සඳහා එම ආයතනය සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අතර ගිවිසුමකට එළඹීම පිණිස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **වාණිජ මට්ටමින් ෆුට්සාල් ගෘහස්ථ ක්‍රීඩාංගණ ස්ථාපිත කිරීම**

ෆුට්සාල් යනු කෘත්‍රිම පිටියක ක්‍රීඩා කෙරෙන පාපන්දු ආශ්‍රිත ක්‍රීඩාවක් වන අතර, මෙම ක්‍රීඩාව සඳහා මීටර් 40x20 සහ උස මීටර් 4 වන ගෘහස්ථ ක්‍රීඩාංගණයක් යොදා ගැනේ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ ආශ්‍රිතව ෆුට්සාල් ගෘහස්ථ ක්‍රීඩාංගණ කිහිපයක් ඉදිකර ඇත. එම ක්‍රීඩාව සඳහා ඉහළ ආකර්ෂණයක් පවතින බැවින්, රාජ්‍ය-පුද්ගලික හවුල්කාරිත්ව

ක්‍රමවේදය යටතේ පුද්ගලික ආයෝජකයෙකුට භූමිය බදු පදනම මත ලබා දී රජය සතු ක්‍රීඩාංගණ පරිශ්‍ර හා ඉඩම් භාවිත කර ෆුට්සාල් ක්‍රීඩාව ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, හඳුනාගනු ලබන රජයේ ඉඩම් හා ක්‍රීඩා සංකීර්ණ පරිශ්‍රයන් තුළ, උපරිම වසර 30ක බදු කාලසීමාවක් සඳහා ෆුට්සාල් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම පිණිස, රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් පුද්ගලික ආයෝජකයෙකු තෝරා ගැනීමටත්, එකී ආයෝජකයා මඟින් පාකිස්ථානු රජයේ ප්‍රදානයක් ලෙස ලබා දෙන ලද කෘතිම ෆුට්සාල් පථ 02 ටොරින්ටන් සහ සුගතදාස ක්‍රීඩා සංකීර්ණයන්හි ඉදිකිරීමටත් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 09. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ යෝජිත දඹුල්ල තාක්ෂණික මණ්ඩපය

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මධ්‍යම, වයඹ, උතුරු මැද සහ නැගෙනහිර පළාත්වල සිවිල් සිසුන් වෙනුවෙන් සිය සේවාවන් ව්‍යාප්ත කිරීමේ අරමුණින් දඹුල්ල නගරයේ තාක්ෂණික මණ්ඩපයක් ස්ථාපිත කිරීම සඳහා සැලසුම් කර ඇත. යෝජිත දඹුල්ල තාක්ෂණික මණ්ඩපය සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීමකින් තොරව නාගරික සංවර්ධන අධිකාරියට අයත් දඹුල්ල නගරයේ පිහිටි පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය බදු පදනම මත ලබාගැනීමටත්, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය යටතේ පාලනය වන ස්වාධීන ආයතනයක් ලෙස යෝජිත තාක්ෂණික මණ්ඩපය පරිපාලනය කිරීමටත් සැලසුම් කර ඇත. ඒ අනුව, එකී තාක්ෂණික මණ්ඩපය ස්ථාපිත කිරීම සඳහා ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 10. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය පාර්ලිමේන්තු පනතක් මඟින් ස්ථාපිත කිරීම

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සඳහා නෛතික පිළිගැනීමක් ලබා දීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස 2021-10-05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත්

කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමටත් ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (SDP) සහනය සහිතව CHEC PORT CITY COLOMBO (PRIVATE) LIMITED වෙත ප්‍රදානය කරනු ලැබ ඇති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම**

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ හඳුනා ගනු ලැබ ඇති ව්‍යාපෘතියක් වන කොළඹ වරාය නගරය ඉදිකිරීමේ කටයුතු CHEC PORT CITY COLOMBO (PRIVATE) LIMITED වෙත 2016 වසරේදී පවරනු ලැබ ඇත. එම ව්‍යාපෘතියේ තවදුරටත් ඉතිරිව ඇති වැඩකටයුතු අවසන් කිරීමටත්, එහි වාණිජ මෙහෙයුම් ඇරඹීම සඳහාත් ව්‍යාපෘති කාලය 2027-06-30 දක්වා දීර්ඝ කිරීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **දිප ව්‍යාප්ත සේවාවන්ට අයත් විධායක නිලධාරීන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ ඉන්දියාවේ යහපාලනය සඳහා වන ජාතික මධ්‍යස්ථානය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම**

ගරු ජනාධිපතිතුමා විසින් 2023 ජූලි මාසයේදී ඉන්දියාවේ සිදු කරන ලද නිල සංචාරය අතරතුරදී ඉන්දීය අග්‍රාමාත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමා සමඟ පැවති ද්විපාර්ශ්වික සාකච්ඡාවලදී ඉන්දියාවේ යහපාලනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය සමඟ හවුල්කාරිත්වයෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ හැකියාවන් සහ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිණිස එකඟතාවකට පැමිණ ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) සහ ඉන්දියාවේ යහපාලනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCGG) අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම පිණිස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**13. කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලා පරිශ්‍රයේ විසිරී ඇති ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය ඉවත් කර, කර්මාන්තශාලා පරිශ්‍රය පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම**

කන්කසන්තුරේ පිහිටා ඇති සිමෙන්ති කර්මාන්තශාලා භූමිය පුරා විසිරී තිබෙන යකඩ හා අනෙකුත් ලෝහ කොටස් එක්රැස් කර කර්මාන්තශාලා පරිශ්‍රය පිරිසිදු කිරීම සඳහා ජාතික තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇත. කර්මාන්ත අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වූ මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසුකරුවන් හය දෙනෙකු (06) ඉදිරිපත් වී ඇති අතර, එයින් තිදෙනෙක් ලංසු ලේඛන අනුව සුදුසුකම් නොලැබීම මත ප්‍රතික්ෂේප වී තිබේ. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ අනුව සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද ලංසුකරු වන ලුමිනෙක්ස් පීඑල්සී වෙත එම ප්‍රසම්පාදනය පිරිනැමීමට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**14. බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය සහ ඊජිප්තුවේ රාජ්‍යතාන්ත්‍රික අධ්‍යයන ආයතනය අතර අවබෝධතා ගිවිසුම**

ශ්‍රී ලංකාව හා ඊජිප්තුව අතර පවතින ඓතිහාසික මිත්‍රත්වය පෝෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් දෙරට අතර රාජ්‍යතාන්ත්‍රික දැනුම හුවමාරු කර ගැනීම සඳහා දෙරටේ රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතන අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ යටතේ රාජ්‍යතාන්ත්‍රිකයන්, විද්වතුන්, නිලධාරීන් හා විශේෂඥයින් මෙන්ම, පර්යේෂකයන් හුවමාරු කර ගැනීමටත්, අධ්‍යයන හා විවිධ සම්මන්ත්‍රණ ආදිය සංවිධාන කරමින් දැනුම හුවමාරු කර ගැනීමටත් පහසුකම් සැලසීමට දෙපාර්ශ්වය අතර එකඟතාවකට පැමිණ තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය සහ ඊජිප්තු අරාබි ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍යතාන්ත්‍රික අධ්‍යයන ආයතනය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ සාදන ලද නියෝග පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ සාදන ලද පහත සඳහන් ගැසට් නිවේදනයන් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* 2024-07-26 දිනැති අංක 2394/67 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2024 අංක 04 දරන කොළඹ වරාය නගරය (අක්වෙරළ බැංකු - මූලික) නියෝග.

* 2024-07-26 දිනැති අංක 2394/66 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2024 අංක 05 දරන කොළඹ වරාය නගරය (අක්වෙරළ බැංකු - විචක්ෂණශීලී කළමනාකරණය සහ විශ්වසනීයත්වය) නියෝග.

16. **ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා විශේෂ පොලී අනුපාතිකයක් නැවත ක්‍රියාත්මක කිරීම**

වර්තමානයේ ස්ථාවර තැන්පතු සඳහා වන පොලී අනුපාතිකය 8.5%ක් දක්වා සැලකිය යුතු මට්ටමකින් අවප්‍රමාණය වී ඇත. ඒ හේතුවෙන් බහුතරයක් ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම් හිමිකරුවන් විසින් සිය තැන්පතු මුදල් ආපසු ලබා ගෙන තිබේ. ඒ අනුව, අවුරුදු 60ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ උපරිමය රුපියල් මිලියනයක් දක්වා වන ස්ථාවර තැන්පතු සඳහා ලබා දෙනු ලබන වාර්ෂික පොලී අනුපාතිකය 10%ක් ලෙස අවුරුදු 02ක කාලයක් සඳහා ලබා දීම පිණිස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

17. **රාජ්‍ය සේවයෙහි පවතින විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම**

රජය විසින් වරින්වර සිදු කරන ලද වැටුප් සංශෝධන මෙන්ම අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද විවිධ ප්‍රතිපත්තිමය තීරණ හේතුවෙන් ඇතැම් විශ්‍රාමික කණ්ඩායමහට විශ්‍රාම වැටුප් විෂමතා නිර්මාණය වී ඇත. ඒ

අනුව, 2016-01-01 දින සිට 2020-01-01 දින දක්වා විශ්‍රාම ගන්නා ලද රාජ්‍ය නිලධාරින්ට යම් අසාධාරණයක් සිදු වී ඇති බව නිරීක්ෂණය වී ඇති අතර, එකී වැටුප් විෂමතාව ඉවත් කිරීම තුළින් විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් 83,000ක පමණ පිරිසකට සහනයක් ලබා දීමට හැකි වේ. එම විශ්‍රාමික නිලධරයන්ගේ විශ්‍රාම වැටුප, 2016-02-25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි උපලේඛන අංක I අනුව සම්පූර්ණ වැටුප පදනම් කර ගනිමින් උපරිම රුපියල් 2,500/-ක වැඩිවීමක් ලැබෙන පරිදි සංශෝධනය කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

18. **ජාතික දේශගුණික අවකාශීය දත්ත සංවර්ධන ව්‍යාපෘතිය**

දේශගුණික විපර්යාස, විචල්‍යතා සහ ආන්තික සිදුවීම්වල බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජනතාව, ජීවනෝපාය, පරිසර පද්ධති, ගොඩනගන ලද යටිතල පහසුකම් සහ ආයෝජන සැලකිය යුතු අවදානමකට ලක්ව ඇත. එකී අවදානම අවම කිරීම පිණිස ශ්‍රී ලංකාව සඳහා දේශගුණික ප්‍රතිවර්තනය පිළිබඳ ආයෝජන මාර්ග සිතියමක් සකස් කර ඇත. එය ක්‍රියාත්මක කිරීමේදී ජාතික දේශගුණික අවකාශීය දත්ත පද්ධතියක් නිර්මාණය කර වැඩිදියුණු කිරීම මූලික සහ අත්‍යවශ්‍ය පියවරක් වශයෙන් හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, සිංගප්පූරුවේ M/s PROCLIME PTE. LTD. සමඟ එක්ව ජාතික දේශගුණික අවකාශීය දත්ත සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**************